## පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/219/2024 (PSC)

ඩී.චින්තක විජේවර්ධන
**අභියාචක**
**එදිරිව**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.02.17**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක ඒ.එම්.වන්සේකර මහතා.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් එන්.පී.එස්.එන්.කුමාරි මිය.

**-නියෝගය-**

## විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා

අභියාචක ඩී.චින්තක විජේවර්ධන යන අය විසින්, 2014.12.18 වෙනි දින මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා පෙත්සම මගින් ඉල්ලා ඇති සහන පහත දැක්වේ.

1. චෝදනා අංක 05, 07, 10 සඳහා වැරදිකරු කර ඇති අතර, එම වැරදිකරු කිරීමෙන් නිදහස් කර දෙන ලෙසත්,
2. විනය නියෝගයේ අංක 01 සිට 05 දක්වා වූ සියලුම දඬුවම් නියෝගය ඉවත් කර දෙන ලෙසත්,
3. විනය නියෝගයේ සඳහන් තදින් තරවටු කිරීම යන දඬුවම ඉවත් කර දෙන ලෙසත්,
4. වැඩ තහනම් කාලයට අදාළ සියලුම වැටුප් ලබා දෙන ලෙසත්,
5. මෙකී සිද්ධිය සම්බන්ධයෙන් අත්හිටුවා ඇති සියලුම වැටුප් වර්ධක ලබා දෙන ලෙසත්,
6. නැවත සේවය ලබාදීමෙන් පසුව කෑගල්ල දිස්ත්‍රික්කයට ලබා දී ඇති ස්ථිර ස්ථාන මාරුව යලිත් වරක් ගම්පහ දිස්ත්‍රික්කයට ලබා දෙන ලෙසත්.

පිටු 03කින් සමන්විත අභියාචනා පෙත්සමෙහි ඉහත සඳහන් සහනයන් ඉල්ලා සිටින්නේ කුමන පදනමක් යටතේද යන්න සම්බන්ධයෙන් කිසිදු සඳහනක් දක්නට නැත. ඒ අනුව අභියාචක කුමන හේතූන් මත ඔහු වෙත ලබාදී ඇති විනය නියෝගය ඉවත් කිරීමට ඉල්ලා ඇත්තේද යන්න පැහැදිලි නැත. කෙසේ වෙතත් මෙම අභියාචනය සම්බන්ධයෙන් වන කරුණු, 2025.11.06 වෙනි දින විනිශ්චය අධිකාරය ඉදිරියේ විමසීමට ගත් අවස්ථාවේ දී, අභියාචක වෙනුවෙන් ඉදිරිපත් කර ඇත. ඊට අමතරව එම කරුණු ලිඛිතව ද, 2015.11.21 වෙනි දින මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ද, 2025.04.03 දිනැති ලිපිය මගින් මෙම කරුණ පිළිබඳව ඔවුන්ගේ ස්ථාවරය ඉදිරිපත් කර ඇත.

අභියාචකගේ මූලික ඉල්ලීම වන්නේ, ඔහු සම්බන්ධයෙන් ලබා දී ඇති විනය නියෝගය හා ඒ අනුව නිකුත් කර ඇති දඬුවම් ඉවත් කර දෙන ලෙසයි. අභියාචකට එරෙහිව චෝදනා දහයක් ඉදිරිපත් කරමින් විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා ඇත. එම පරීක්ෂණය අවසානයේ දී අංක 5, 7, සහ 10 චෝදනා වලට අභියාචක වැරදිකරු බවට පත්කර ඇති අතර, ඉතිරි චෝදනා වලින් අභියාචක නිදොස් කර ඇත. වරදකරු කර ඇති චෝදනා පහත දක්වේ.

**V.** **ඔබ සමෘද්ධි සංවර්ධන නිලධාරී ඊ.කෝකිලා සංජීවනී යන අය සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ මීරිගම ශාඛාවෙන් 2017.04.11 දින හෝ ඊට ආසන්න දිනක රු.50,000/=ක් හෝ ඊට ආසන්න ණය මුදලක් ලබා ගැනීම ගම්පහ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ (එවකට දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ) අයේෂ් එම්.පෙරේරා මහතාගේ අත්සන ව්‍යාජ හා කූඨ ලෙස යෙදූ වැටුප් අවකරණ වාර්තාවක් ලබා දීම හා/හෝ ඔබගේ රාජකාරී වගකීම පැහැර හැරීම.**

**VII.** **රජයේ නිලධාරීන් මූල්‍ය දුෂ්කරතාවලින් නොපෙළිය යුතුය යන්න ආයතන සංග්‍රහයේ පැහැදිලිව දක්වා තිබියදී 2017.04.11 දින හෝ ඊට ආසන්න දිනකදී රාජ්‍ය බැංකුවකින් ඔබගේ නමින් ලබාගන්නා ලද ණය මුදල් හිතාමතා ගෙවීම් පැහැර හැරීම හා/හෝ ඔබගේ රාජකාරී වගකීම් පැහැර හැරීම.**

**X.** **ඔබ ඉහත අංක I සිට IX දක්වා චෝදනා වල සඳහන් වැරදි එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ සිදුකිරීම හේතුවෙන් ඔබගේ තනතුරත්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවත්, පොදුවේ රාජ්‍ය සේවයත් අපකීර්තියට පත්කිරීම.**

5 වන චෝදනාව ඉදිරිපත් කර ඇත්තේ, කෝකිලා සංජීවනී යන සංවර්ධන නිලධාරිණිය වෙනුවෙන් ජාතික ඉතිරි කිරීමේ බැකුවේ මීරිගම ශාඛාවේ 2017.04.11 දින හෝ ඊට ආසන්න දිනයක රුපියල් පනස්දහසක් (රු.50,000/=) හෝ ඊට ආසන්න ණය මුදලක් ලබාගැනීම සඳහා, අයේෂ් එම්. පෙරේරා යන අයගේ අත්සන ව්‍යාජ හා කූඨ ලෙස යොදා, වැටුප් අවකරණ වාර්තාවක් ලබාදීමයි. එකී කෝකිලා සංජීවනී යන අය සාක්ෂි ලබාදී ඇත. ඇය පවසා ඇත්තේ, ඇය විසින් රුපියල් පනස් දහසක (රු.50,000/=) ණය මුදලක් ඉල්ලා සිටි බවත්, එම ණය මුදල ලබාගැනීම සඳහා 2017.04.06 දිනැති වැටුප් අවකරණ ලිපි දෙකක් අභියාචක විසින් ඇයට පෙන්වා ලබාදුන් බවත්ය. ඒවා ණය අවකරණ ලිපි බවත්, එහි තිබූ අත්සන දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂකගේ නොවන බවට, ඇය පසුව දැනගත් බවටත් ඇය විසින් පවසා ඇත. ඇයගේ නමින් නිකුත් කර තිබූ එකී අවකරණ ලිපිය පැ.14 ලෙසට සළකුණු කර ඉදිරිපත් කර ඇත. පැ.13 ලෙසට සළකුණු කර ඉදිරිපත් කරන ලද ලේඛනය අභියාචකගේ නමින් නිකුත් කරන ලද වැටුප් අවකරණ ලිපියයි. එම ලිපි දෙකම ඉහත කී සංජීවනී යන අය දැක තිබී ඇති අතර, එහි තිබූ සමෘද්ධි අධ්‍යක්ෂකගේ අත්සන ඇය නොහඳුනන බවටත් ප්‍රකාශ කර ඇත. ඉහත කී මුදල් ලබා ගැනීම සඳහා වැටුප් අවකරන ලිපි අත්සන් තැබිය යුත්තේ, දිස්ත්‍රික් දිවි නැගුම අධ්‍යක්ක ලෙස කටයුතු කළ අයේෂ් එම්. පෙරේරා යන අය විසින් ය. විධිමත් විනය පරීක්ෂණය පවත්වන අවස්ථාව වන විට එකී අයේෂ් එම්. පෙරේරා මියගොස් ඇත. නමුත් එම තැනැත්තා සේවය කළ කාර්යාලයේ සේවයේ නියුතුව සිටි සමෘද්ධි කළමනාකරු වන එස්.පී.ඩී.ගුණසේකර යන අය ප්‍රකාශ කර ඇත්තේ, ඇය අයේෂ් එම්. පෙරේරා යන අය වසර 08ක පමණ කාලයක් රාජකාරීමය වශයෙන් හඳුනන බවත්, ඔහුගේ අත්සන හොඳින් හඳුනන බවත් ය. ඊට අමතරව සජානි මීනා සමරකෝන් නමැති අය ප්‍රකාශ කර ඇත්තේ, පැ.13 සහ පැ.14 යන ලේඛන දෙක ණය අවකරණ සඳහා බැංකුවට ලබාදෙන ලිපි දෙකක් බවත්, එහි තිබූ අත්සන් අයේෂ් පෙරේරාගේ නොවන බවත් ය. ඇය එසේ පවසා සිටින්නේ අයේෂ් පෙරේරා යන අයගේ අත්සන ඇය හොඳින් හඳුනන නිසා බවත් ය. ඒ අනුව අයේෂ් පෙරේරා මියගොස් ඇති නිසා, ඔහු සාක්ෂියට කැඳවා නොතිබුණත්, ඔහු සමඟ වර්ෂ ගණනාවක් තිස්සේ සේවය කළ අයේෂ් පෙරේරාගේ අත්සන, සාක්ෂිකරුවන් දෙදෙනා හොඳින් හඳුනන නිසා, ඉහත කී පැ.13 සහ පැ.14 වශයෙන් සළකුණු කර ඇති ලේඛන වල ඇති අත්සන අයේෂ් පෙරේරාගේ නොවන බවට, එම දෙදෙනා විසින් දී ඇති සාක්ෂිය පිළිගැනීම වරදක් වන්නේ නැත.

මේ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර ඇති, 2025.04.03 දිනැති නිරීක්ෂණ වාර්තාවේ සඳහන් කර ඇත්තේ, ආයතන සංග්‍රහයේ දෙවන වෙළුමේ, XLVIII පරිච්ඡේදයේ 21:12 වගන්තිය යටතේ විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා ගෙන යන අතරතුරදී, නිලධරයෙකුගේ අත් අකුරු හෝ අත්සන පිළිබඳව හෝ ගැටළුවක් උද්ගත වූ අවස්ථාවකදී, එම නිලධාරියාගේ අත් අකුරු හෝ අත්සන් හෝ මැනවින් හඳුනන සාක්ෂිකරුවන් දෙදෙනෙකු විසින් එම අත්සන හඳුනා ගැනීම, මියගිය අයෙකුගේ අත්සන තහවුරු කර ගැනීම සඳහා ප්‍රමාණවත් වන බවයි. එම විධිවිධාන යටතේ ක්‍රියා කරමින්, පැ.13 සහ පැ.14 යන ලේඛන වලට තබා ඇති අත්සන්, අයේෂ් පෙරේරා යන අයගේ නොවන බවට සාක්ෂිකරුවන් දෙදෙනෙකු විසින් පැහැදිලිව ප්‍රකාශ කර ඇති නිසා, එය පිළිගනිමින් කටයුතු කර තිබීම නිවැරදිය. ඒ අනුව අභියාචක විසින් ව්‍යාජ අත්සන් යොදා ඇති ලේඛන දෙකක් ඉදිරිපත් කරමින් රජයේ මුදල් ලබා ගැනීමට කටයුතු කර තිබූ බවට ගෙන ඇති තීරණයෙහි දෝෂයක් පෙනෙන්නට නැත. ඒ අනුව අභියාචකට එරෙහිව ඉදිරිපත් කර ඇති 5 වන චෝදනාවට ඔහු වැරදිකරු බවට පත්කිරීම නිවැරදි බවට තීරණය කරමු.

අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ 07 වන චෝදනාව වන්නේ, රාජ්‍ය බැංකුවකින් ලබාගන්නා ලද ණය මුදල් ගෙවීම හිතාමතාම පැහැර හැර තිබීම හෝ ඒ සම්බන්ධයෙන් වන රාජකාරී වගකීම පැහැර හැර තිබීමයි. මෙම කරුණ සම්බන්ධයෙන් මීරිගම ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ කළමනාකරුවෙකුව සිටි එන්.ඩී.සී.ඩී.කුලරත්න යන අය සඳහන් කර ඇත්තේ, අභියාචක වෙත රුපියල් පනස් දහසක (රු.50,000/=) මුදලක්, ණය මුදලක් වශයෙන් 2017.04.11 දින ලබා දී තිබූ බවයි. එම ණය මුදල වාරික වශයෙන් ආපසු ගෙවිය යුතුව තිබුණත්, එම මුදල් ආපසු ගෙවා නොතිබූ බවට එම සාක්ෂිකරු පැහැදිලිව සාක්ෂි දී ඇත. ඒ අනුව අභියාචකගේ නමින් රුපියල් හැට එක්දහස් හයසිය දොළහයි, ශත අනූ අටක (රු.61,612.98) මුදලක් ණය ශේෂය වශයෙන් අයවීමට තිබෙන බවටත් ඔහු පැහැදිලිව සාක්ෂි දී ඇත. ඒ සම්බන්ධයෙන් සමථ මණ්ඩලය ඉදිරියේ තිබූ ආරවුල සමථ නොවූ බවට නිරවුල් නොකිරීමේ සහතිකයක් ද නිකුත් කර ඇත.

ඉහත කී සාක්ෂි කිසිදු හබ කිරීමකට ලක්වී නොමැත. ඒ අනුව අභියාචක විසින් ඔහුගේ තනතුර හේතුවෙන් රුපියල් පනස් දහසක (රු.50,000/=) මුදලක් ලබා ගෙන තිබූ බවත්, එම මුදල සම්බන්ධයෙන් වන ගෙවිය යුතු සම්පූර්ණ මුදල නොගෙවා ඇති බවටත් පැහැදිලිව තහවුරු වී ඇත. ඒ අනුව අභියාචක 07 වන චෝදනාවට වරදකරු කිරීමේ දෝෂයක් පෙනෙන්නට නැත.

10 වන චෝදනාව පදනම් වී ඇත්තේ අභියාචක වෙත යොමු කර තිබූ සියළු චෝදනා මතය. 5 සහ 7 චෝදනා වලට අභියාචක වරදකරු බවට පත්වී ඇති නිසා, 10 වන චෝදනාවට ද අභියාචක වරදකරු බවට පත්කිරීම වැරදි සහගත නොවේ.

ඉහත කරුණු සළකා බලා, අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා 03කට ඔහු වරදකරු බවට පත් කිරීම සම්බන්ධයෙන් මැදිහත්වීමට මෙම විනිශ්චය අධිකාරය කැමැත්තක් දක්වන්නේ නැත. එසේ වරදකරු කිරීම හේතුවෙන් නියම කර ඇති දඩුවම් කෙරෙහි ද විශේෂ අවධානය යොමු කරන ලදි. වරදකරු බවට පත්ව ඇති චෝදනා බරපතල ගණයට අයත්වේ. එබැවින් එවැනි චෝදනාවන් සම්බන්ධයෙන් අභියාචක වෙත ලබා දී ඇති දඩුවම් ද වෙනස් කිරීමට මෙම විනිශ්චය අධිකාරය අදහස් කරන්නේ නැත.

ඉහත කරුණු සළකා බලා අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනය නිශ්ප්‍රභ කිරීමට තීරණය කරමු.

අභියාචනය නිශ්ප්‍රභ කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

(ජේ.ජේ.රත්නසිරි)
(සාමාජික)

මම එකඟ වෙමි

(එස්.නන්දසේකරන්)
(සාමාජික)

ලලිතා/-